# <u>වෙනස්කම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරිම සඳහා වූ උපදෙස්</u>

ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමට ප්‍රථම පහත සඳහන් උපදෙස් හොඳින් අධ්‍යානය කරන්න.

## <u>ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරිම සඳහා උපදෙස්</u>

1. මෙම ප්‍රකාශය මුල් ලියාපදිංචි කිරීමේ සහතිකය සමඟ ඉදිරිපත් කළ යුතුය.
2. වෙනස , වෙනස්කම් පැහැදිලිව සටහන් කළ යුතුය.
   උදාහරණ : ව්‍යාපාර ස්වභාවය වෙනස් කිරීම , ව්‍යාපාර ලිපිනය වෙනස් කිරීම ආදි වශයෙන්
3. වාර්තාව ඉදිරිපත් කරන්නේ තනි පුද්ගලයෙක් නම් ඔහු විසින් අත්සන් කළ යුතුය.
4. හවුල් ව්‍යාපාරයක් වෙනුවෙන් නම් එහි හවුල්කරුවන් සියලුදෙනාම තම තමන්ගේ අත්සන වෙන වෙනම එහි තැබිය යුතුය. ඉල්ලුම්පත්‍රය මඟින් ප්‍රකාශිත තොරතුරු හවුල්කරුවන් විසින් වෙන වෙනම දිවුරුම් සහතිකයක්/ ප්‍රතිඥා ප්‍රකාශයක් මඟින් සනාථ කර ඉදිරිපත් කළ යුතු ය.
5. නව හවුල්කරුවන් බඳවා ගැනීමේ දී මුලකුරුවලින් හැඳින්වෙන වාසගම සහිතව ඔවුන්ගේ සම්පූර්ණ නම, පදිංචි ස්ථාන ආදි විස්තර සැපයිය යුතුය.
6. අලුත් හවුල්කරු ද ඇතුළත්ව සියලුම හවුල්කරුවන් විසින් ඉල්ලුම්පත්‍රය අත්සන් කළ යුතු ය.

## <u>වෙනස්කම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරිමේ දී ලබා ගත යුතු ලියවිලි</u>

I. බීඑන්ආර් - 05 ආකෘති පත්‍රය

II. අයිතිකරුගේ ජාතික හැඳුනුම්පතෙහි හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයෙහි හෝ වලංගු රියදුරු බලපත්‍රයෙහි සත්‍ය පිටපත

III. ව්‍යාපාරය පවත්වා ගෙන යන බවට ග්‍රාම නිලධාරි වාර්තාව (මෙය ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර තිබිය යුතුය.)

IV. අවසන් වරට නිකුත් කරන ලද ව්‍යාපාර නාම ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත

V. හවුල් ව්‍යාපාරයක් නම්, ඉල්ලුම්පත්‍රය මගින් ප්‍රකාශිත තොරතුරු සනාථ කිරීම සඳහා සියලුම හවුල්කරුවන් විසින් වෙන වෙනම ඉදිරිපත් කරනු ලබන දිවුරුම් සහතිකය, ප්‍රතිඥා ප්‍රකාශය

VI. ව්‍යාපාරික ස්ථානය සම්බන්ධයෙන් හිමිකම පැවරුණු බව තහවුරු කරනු ලබන ඔප්පුවෙහි හෝ බදු ගිවිසුමෙහි හෝ කුලී ගිවිසුමෙහි හෝ නොතාරිස්වරයෙකු සහතික කරන ලද පිටපත

ව්‍යාපාරික ස්ථානය සම්බන්ධයෙන් වෙනත් පාර්ශවයක් වෙත ඔප්පුවක් මඟින් හිමිකම පැවරී ඇති අවස්ථාවක, ඉහත ලේඛනයට අමතරව, විෂයගත දේපළ සම්බන්ධයෙන් ඉල්ලුම්කරන්නාට ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම සඳහා දේපළෙහි අයිතිවාසිකම් ඇති පාර්ශවය විසින් නිත්‍යානුකූල අවසරයක් ලබා දෙන බවට හෝ ලබා දී ඇති බවට කරනු ලබන දිවුරුම් ප්‍රකාශයක් හෝ ප්‍රතිඥා ප්‍රකාශයක් හා අයිතිවාසිකම් ඇති පාර්ශයේ ජාතික හැඳුනුම්පතෙහි හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයෙහි හෝ වලංගු රියදුරු බලපත්‍රයෙහි සත්‍ය පිටපත

**VII.** රෙජිස්ට්‍රාර් විසින් අවස්ථානුකූලව කැඳවිය හැකි වෙනත් ලියවිලි ඇතොත් ඒවා